# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,422 - 2025 ජනවාරි මස 31 වැනි සිකුරාදා - 2025.01.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | 18 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 පෙබරවාරි මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 පෙබරවාරි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


17 - B 082650 — 177 (2025/01)
C 1 -

# පිස්කල් විකිණීම්

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

පබ්ලික් බෑන්ක් බර්හාඩ්,
අංක 340, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03 සහ කලින්
අංක 324, ගාලු පාර, කොළඹ 03.

*...........පැමිණිලිකරු.*

*නඩු අංකය* : HC/Civil/495/2010/MR
*ඇස්කිසි අංකය* : 54/2024
*වටිනාකම* : රු. 59,655,093.73
*ස්වභාවය* : මුදල්
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය

*එදිරිව*

01. ඒ. ඊස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(A-ESS) (Private) Limited,
අංක 79, කුමාර වීදිය, කොළඹ 11, සහ,
එෆ් 19, පළමු මහළ, ලකී ප්ලාසා, කොළඹ 03, සහ
අංක 39 1/1, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03, සහ
අංක 267/23, ගාලු පාර, කොළඹ 03.

02. කෙසාකුට් කොවුකැටන් ගංගාදරන්,
අංක 79, කුමාර වීදිය, කොළඹ 11, සහ
අංක 267/23, ගාලු පාර, කොළඹ 03.

03. පුවාතින්කාඩවිල් වේලප්පන් පද්මාවතී ගංගාදරන්,
අංක 79, කුමාර වීදිය, කොළඹ 11, සහ,
අංක 267/23, ගාලු පාර, කොළඹ 03.

04. ගංගාදරන් සතීෂ්,
අංක 79, කුමාර වීදිය, කොළඹ 11, සහ,
අංක 267/23, ගාලු පාර, කොළඹ 03.

*.............විත්තිකරුවන්.*

වර්ෂ 2023ක් වූ ජනවාරි මස 19 වැනි දින මේ නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව 01 වන හා 04 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු පහත දක්වා ඇති මුදල් 01 වන හා 04 වන විත්තිකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා 01 වන හා 04 වන විත්තිකරුවන්ගේ ඉඩම්, ගෙවල්, ගොඩනැගිලි, ව්‍යාපාරික ස්ථාන, බඩු මුට්ටු, යාන වාහන සහ අනෙකුත් වත්කම් සහ අය විය යුතු ණය සහ බැරකම් තහනම් කිරීමෙන් අවශ්‍ය වුවහොත් 01 වන හා 04 වන විත්තිකරුවන්ගෙන් ලබා ගත යුතු බවටත්,

එනම්,

(*අ*) පළමුවන නඩු නිමිත්ත මත රු. 9,472,243.18 ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2003 සැපැතැම්බර් 01 වැනි දින සිට වාර්ෂිකව 19% බැගින් වූ රු. 7,650,000/- ක ඉතිරි මුල් මුදල් ප්‍රමාණයක් මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්,

(*ආ*) දෙවන නඩු නිමිත්ත මත රු. 1,248,419/- ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් සැප්තැම්බර් 01 වන දින සිට වාර්ෂික 25% බැගින් රු. 946,360/- ක මුල් මුදල් ප්‍රමාණයක් මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්,

(*ඇ*) තුන්වන නඩු නිමිත්ත මත රු. 3,103,365.03 ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2003 සැප්තැම්බර් 01 වැනි දින සිට වාර්ෂිකව 25% බැගින්, රු. 1,942,500/- ක මුල් මුදල් ප්‍රමාණයත් මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්,

(ඇ) හතරවන නඩු නිමිත්ත මත රු. 1,654,778.57 ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2003 සැප්තැම්බර් 01 වැනි දින සිට වාර්ෂිකව 25% බැගින්, රු. 1,058,600/- ක මුල් මුදල් ප්‍රමාණයත් මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්,

(ඉ) පස්වන නඩු නිමිත්ත මත රු. 3,051,232.73 ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2003 සැප්තැම්බර් 01 වැනි දින සිට වාර්ෂිකව 25% බැගින්, රු. 1,966,000/- ක මුල් මුදල් ප්‍රමාණයත් මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්,

(ඊ) හයවන නඩු නිමිත්ත මත රු. 699,663.68 ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2003 සැප්තැම්බර් 01 වැනි දින සිට වාර්ෂිකව 25% බැගින්, රු. 452,400/- ක මුල් මුදල් ප්‍රමාණයත් මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්,

(උ) හත්වන නඩු නිමිත්ත මත රු. 967,589.99/- ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2003 සැප්තැම්බර් 01 වැනි දින සිට වාර්ෂිකව 25% බැගින්, රු. 626,100/- ක මුල් මුදල් ප්‍රමාණයත් මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්,

(ඌ) අටවන නඩු නිමිත්ත මත රු. 6,518,506.95 ක මුදලක් ද, එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2003 සැප්තැම්බර් 01 වැනි දින සිට රු. 5,000,000/- ක මුදලක් දක්වා වාර්ෂිකව 21% බැගින් රු. 1,518,506.95ක ඉතිරි මුදල් ප්‍රමාණය මත වාර්ෂික 30% බැගින් ඒ මත පොළිය ද සමඟ අයකර දෙන ලෙසත්, මෙයින් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 01 වන සහ 04 වන විත්තිකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ. ව. 11.00**ට, ඉහත නම් සඳහන් 01 වන සහ 04 වන විත්තිකරුවන්ගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛන 1**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 හි කොල්ලුපිටිය පාරේ පිහිටි වරිපනම් අංක 267/23 දරන ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. එම්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 1418 සහ 1974.11.10 වන දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක ජී දරන ඉඩමට මායිම්, (කොල්ලුපිටිය පාරේ පිහිටි වරිපනම් අංක 267 දරන ඉඩමට උප බෙදුමක් වශයෙන්), උතුරට : ලොට් ආර්. 1 (පාරක් සඳහා වෙන්කළ අඩි 30ක් පළල පාර ද), නැගෙනහිරට : ලොට් අයි ද, දකුණට : කොල්ලුපිටිය පාරේ පිහිටි වරිපනම් අංක ජී 269 දරන පරිශ්‍රය සහ බටහිරට : ලොට් ඉ යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම හයයි පහ (පර්. 11.65) ක් පළල බිම් කැබැල්ල වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඒ/871/243 හි ලියාපදිංචි කර ඇත.

**උපලේඛන 2**

01. ඉහත කී කොල්ලුපිටියේ පිහිටි කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 267 (කොටසක්) දරන ඉඩමට ඉහත කී 1418 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක ආර් 1 දරන කොටසට මායිම්, උතුරට : ඉහත කී පිඹුරේ බී. ඩී. එෆ්. සහ එච් යන කැබලි ද, නැගෙනහිරට : කැබලි අංක ආර්. 2 (අඩි 20 පළල පාරක් සඳහා වෙන් කළ කොටස සහ ඉහත කී පිඹුරේ කැබලි අංක අයි දරන කොටස) ද, දකුණට : ඉහත කී පිඹුරේ ඒ. සී. ඉ. සහ ජී. යන කොටස් සහ බස්නාහිරට : කොල්ලුපිටිය පාර යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1418 දරන පිඹුර ප්‍රකාර පර්චස් හය (පර්. 6) ක් විශාල බිම් තීරය වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඒ/871/192 හි ලියාපදිංචි කර ඇත.

02. ඉහත කී කොල්ලුපිටිය, කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 හි පිහිටි ඉහත කී අංක 1418 දරන පිඹුර ප්‍රකාර අඩි 20 පළල පාර සඳහා බෙදා වෙන් කළ කැබලි අංක ආර්. 2 දරන (කොල්ලුපිටිය පාරේ පිහිටි වරිපනම් අංක 267 දරන දේපලෙන් බෙදා වෙන් කළ කොටසක්) කොටසට මායිම්, උතුරට : එච්. ජේ. එල්. සහ ආර්. 3 (අඩි 5 පළල පාර සඳහා වෙන් කළ කොටස) දරන කොටස් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ කැබලි අංක එන් සහ ඕ දරන කොටස් ද, දකුණට : ඉහත කී පිඹුරේ කැබලි අංක අයි. කේ. සහ එම්. දරන කොටස ද, බස්නාහිරට : කැබලි අංක ආර්. 1 (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කළ කොටස) සහ ඉහත කී අංක 1418 දරන පිඹුර අනුව පර්චස් දොළහයි දශම තුනයි හතර (පර්. 12.34) ක් විශාල බිම් තීරය වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඒ/871/193 හි ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් මුදලින් ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ක මුදල ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2025ක් වූ ජනවාරි මස 16 වැනි දින දී ය.

01-743